# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 141 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 25/01/2024 පැය 2245

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

### 01. තියුණු ආයුධයකින් පහරදී බරපතල තුවාල සිදු කිරීමක් - ඌරගස්මංහන්දිය පොලිස් වසම.

2024.01.25 වන දින උදෑසන කාලයේ ඌරගස්මංහන්දිය පොලිස් වසමේ යටගලකන්ද ප්‍රදේශයේදී පුද්ගලයෙකුට තවත් පුද්ගලයින් දෙදෙනෙකු විසින් තියුණු ආයුධයකින් පහරදී වම් අත වෙන් වන ලෙසට කපා හිසටද පහරදී බරපතල තුවාල සිදුකිරීමක් සම්බන්ධව ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් සිදුකර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 32 ක් වන යටගලකන්ද ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

තුවාලකරු වෙළෙඳසැකට ගොස් එමින් සිටියදී, මෙම පහරදීම සිදුකර ඇති අතර පුද්ගලික ආරවුලක් මත මෙම පහරදීම සිදුකරන ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. අනතුරුව තුවාලකරු ප්‍රතිකාර සඳහා ඇල්පිටිය රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කරාපිටිය රෝහලට ඇතුලත් කර ඇත. මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ඌරගස්මංහන්දිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. දියේ ගිලී පුද්ගලයෙකු මියගොස් තවත් පද්ගලයෙකු අතුරුදහන්වීමක් - තංගල්ල පොලිස් වසම.

2024.01.24 වන දින සවස් කාලයේ තංගල්ල පොලිස් වසමේ කුඩාවැල්ල ධීවර වරාය අසල මෝදරවත්ත මුහුදු තීරයේ දිය නාමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු දියේ ගිලී අතුරුදහන්ව ඇති බවට තංගල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ප්‍රදේශවාසීන්ගේද සහය ඇතිව එක් පුද්ගලයෙකුගේ මෘත ශරීරය සොයාගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වන හග්ගලවත්ත, කළුතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම පුද්ගලයින් දෙදෙනා තවත් මිතුරන් තිදෙනෙකු සමඟ කඹුරුපිටිය ප්‍රදේශයේ සිට විනෝද චාරිකාවක් සඳහා පැමිණ මෝදරවත්ත මුහුදු තීරයේ දියනාමින් සිටියදී මෙම අනතුරට ලක්ව ඇති අතර දියේ ගිලී අතුරුදහන් වූ අනෙක් පුද්ගලයා **වයස අවුරුදු 25 ක් වූ උයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් හා නාවික හමුදා නිලදාරීන්ගේ සහය ඇතිව තංගල්ල පොලිසිය අතුරුදහන්වූ අනෙක් පුද්ගලයා සොයා වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.